FUTURE CULTURE
Connecting Staten Island's Waterfront

# ෆියුචර් කල්චර්

## ස්ටේටන් දූපතේ ජලතීරය සම්බන්ධ කිරීම

**"මෙහි සංස්කෘතීන් හා ශක්තීන් බොහෝ කාලයක පටන්ම හුවමාරු කර ගනු ලැබුණු අතර**, පරදුවට තබනු ලැබ ඇත්තේ ද එයයි" යනුවෙන් *ෆියුචර් කල්චර්* ක්‍රියාත්මක සමූහයෙහි දෙවැනි සමුළුවෙහි දී විලියම් මොරිස් විසින් ප්‍රකාශ කරනු ලැබීය. ඔහුගේ මෙම නිරීක්ෂණය විවෘතභාවය හා බෙදාහදා ගැනීම ඔස්සේ නිර්ණිත සජීවී හා විවිධාංගීකෘත සංස්කෘතියක කේන්ද්‍රස්ථානය වූ උතුරු වෙරළ, හුවමාරු කර ගැනීමේ මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කළ බොහෝ දෙනා අතරේ වූවකි.

නිව්යෝක් වීල්, එම්පයර් අලෙවිසැල්, අර්බි හා නව ස්ටේප්ල්ටන් ජලතීරය, ප්‍රදීපාගාර තුඩුව හා බේ වීදි සැරුම් තීරු ප්‍රතිකලාපකරණය ආදී සුවිසල් වෙනස්කම් අතරේ ඇතැම් පදිංචිකරුවෝ ඔවුන් ජීවත් වන ප්‍රදේශවලට ආසන්න ස්ථාන කිසිවක් නොලියූ හිස් කඩදාසියක් ලෙස සලකනු ලැබෙන බවට හා උතුරු වෙරළට අනන්‍ය වූ සංස්කෘතිය විනාශ වී යෑමේ තර්ජනයට මුහුණ පා ඇති බවට බිය සැක පළ කරති. *ෆියුචර් කල්චර්:* ස්ටේටන් දූපතේ ජලතීරය සම්බන්ධ කිරීම නම් වූ ස්ටේට්න් අයිලන්ඩ් ආර්ට්ස්හි සහකාරීත්වයෙන් ඩිසයින් ට්‍රස්ට් මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය මගින් උතුරු වෙරළේ විචිත්‍රවත් සංස්කෘතික ජන කොට්ඨාස විසින් සංවර්ධනය වන ජලතීරයෙහි අනුලක්ෂණ හැඩ ගැස්වීමෙහි ලා අර්ථාන්විත භූමිකාවක් රඟ දක්වමින් එහි අනාගතය සම්බන්ධයෙන් අඛණ්ඩ පරදුවක් තබන බව සහතික කරයි. මෙමගින් කෙටිකාලීන හා දිගුකාලීන සංස්කෘතික මැදිහත්වීම් සඳහා ඇති අවස්ථාවන් හා ස්ථාන හඳුනා ගනිමින් ශිල්පාත්මක හා සංස්කෘතික ක්‍රියාකරුවන් හා ක්‍රියාකාරකම් සඳහා සහයෝගය දක්වමින් දැනටමත් තිබෙන දෑ වාර්තා කිරීම මෙයට අයත් වේ.

ෆියුචර් කල්චර් පුවත්පතේ පසුගිය සංස්කරණයෙන් පසු ව්‍යාපෘති කණ්ඩායම මගින් සැසි වාර හයක ක්‍රියාකාරී සමූහයක් කැඳවා උතුරු වෙරළ සංවිධාන, නගර නියෝජිතායතන හා පෞද්ගලික පාර්ශ්වකරුවන් හමු විය. ජල තීරය හරහා කලා හා සංස්කෘතික මැදිහත්වීම් සඳහා මූලික නිර්දේශ පද්ධතියක් නිර්මාණය කර ගැනීම සඳහා ඔවුන් විසින් මෙකී සැසියන්ගෙන් ලබාගත් ප්‍රතිපෝෂණයන් හා අදහස් සම්පාදනය කරනු ලැබීය. මේ වන විට සියයකට අධික සංවිධාන සංඛ්‍යාවක් හා පුද්ගලයන් පිරිසක් අදාළ නිර්දේශ කෙටුම්පත නිරීක්ෂණය කරමින් සිටින අතර එහි සාරාංශයක් 4 වැනි පිටුවෙහි දක්වා ඇත. මාර්තු මාසය පුරාවට ඩිසයින් ට්‍රස්ට්, ස්ටේටන් අයිලන්ඩ් ආර්ට්ස් හා ෆියුචර් කල්චර්හි පිරිස් මෙම පුද්ගලයන් විසින් සමාලෝචනය කරන ලද අදහස් දැක්වීම් අවසාන වාර්තාවට සමයෝජනය කරනු ඇත. වර්ෂ 2017 මාර්තු 28 වැනි දින අර්බිහි පිහිටා ඇති ස්ටේට්න් අයිලන්ඩ් ආර්ට්හි නවතම කාර්යයාලයේ දී මූලික ෆියුචර් කල්චර් නිර්දේශ උත්සවාකාරයෙන් දොරට වඩම්මනු ඇත.

ෆියුචර් කල්චර්හි කොටස්කරුවකු වීමට මාර්තු 28 වැනි දා ස්ටේට්න් අයිලන්ඩ් ආර්ට්ස්, 23 නාවුක ප්‍රාකාරාංගණයේ දී ප.ව. 7.00-8.30 දක්වා පැවැත්වෙන නිර්දේශ දොරට වැඩුමට සහභාගී වන්න. නැතහොත් futureculture@designtrust.org. ඔස්සේ ව්‍යාපෘති කණ්ඩායම අමතන්න.

---

***ෆියුචර් කල්චර් ක්‍රියාත්මක සමූහය ගැන***

කලාකරුවන්, සුළු ව්‍යාපාර හිමිකරුවන්, කලා කළමනාකරුවන්, පරිසරවේදීන්, ප්‍රජා ක්‍රියාකාරීන් හා වෙනත් පාර්ශ්වකරුවන්ගෙන් සැදුම් ලත් ෆියුචර් කල්චර් ක්‍රියාකාරී සමූහය මගින් සැසි වාර හයක කාල පරිච්ඡේදය තුළ දී උතුරු වෙරළේ අතීත හා වර්තමාන සංස්කෘතික වත්කම්, සම්බන්ධතා රහිත සහ අවස්ථාවන් සහිත ක්ෂේත්‍ර සහ ස්ථේථාන් දූපතේ විවට වූ සංස්කෘතික ප්‍රජාවන්ගේ අවශ්‍යතා හඳුනා ගනු ලැබීය. මෙම ව්‍යාපෘතියේ අරමුණු උදෙසා සංස්කෘතිය යන්න පුළුල් වපසරියක් තුළ අර්ථකථනය කෙරේ: මිනිසුන්ගේ ගම් රටවල්, ඔවුන් පරිභෝජනය කරන ආහාර, ඔවුන් සංචාරය කරන ආකාරය, ඔවුන් නිර්මාණය කරනු ලබන කලා, ඔවුන් විසින් උසුරුවන භාෂා සහ ඔවුන් තුළ කම්පනයක් ඇති කළ හැකි දෑ ද මීට අයත් වේ. සංස්කෘතික ප්‍රජාව යන්නට උක්ත සංස්කෘතියේ පුළුල් ආකෘතීන් නිර්මාණය, නිෂ්පාදනය, බෙදා හැරීම හා පලනයට සහභාගි වන සියලුම දෙනා අයත් වේ.

ක්‍රියාකාරී සමූහය මගින් ඩිසයින් ට්‍රස්ට් කණ්ඩායම වෙත උතුරු වෙරළට සුවිශේෂීභවක් ගෙන දෙන්නා වූ මිනිසුන් හා ස්ථාන පිළිබඳව තොරතුරු රැසක් ලබා දුනි. ප්‍රතිපත්ති පිළිබඳ කටයුතු කරන බෙන් මාගොලිස් විසින් සිදු වෙමින් පවතින සංවර්ධනය හා ප්‍රතිකලාපකරණය ඔස්සේ බලාපොරොත්තු විය හැකි ධනාත්මක, ඍණාත්මක, උදාසීන හා සියුම් වෙනස්කම් යනා දී ප්‍රතිවිපාකයන් පිළිබඳ තොරතුරු කණ්ඩායම වෙත ලබා දුන්නේය. නාගරික සැලසුම් ශිල්පී මාර්ජී රඩික් විසින් අන්තර් ක්‍රියාකාරී සිතියම්කරණ අභ්‍යාස මෙහෙයවන ලදී. උතුරු වෙරළ ප්‍රජා සංවිධානයන්ගේ නියෝජිතයින් තිදෙනෙකු විසින් ඔවුන්ගේ අදහස් පිළිබඳ ප්‍රතිපෝෂණයන් ලබා දෙමින් ඔවුන්ගේම පූර්ව මුල පිරීම් ඔස්සේ ලබාගත් දැනුම බෙදා හදා ගත් “සාධ්‍යතා” සැසියක් ද ක්‍රියාකාරී සමූහයට ඇතුළත් විය.

කතා, ප්‍රතිපෝෂණයන් හා විශේෂිත නිර්දේශවලට අමතරව ෆියුචර් කල්චර් නිර්දේශයන් නිර්මාණකරණයට මාර්ගෝපදේශනය සැපයීම සඳහා මූලධර්ම හයක් නිර්ණය කර ගැනීම සඳහා ද ක්‍රියාකාරී සමූහය විසින් සහාය දක්වන ලදී. එකී මූලධර්මයන් වනුයේ:

1. **ෆියුචර් කල්චර් පූර්වාලෝකනය**
සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා ප්‍රගාමී හා තිරසාර භූමිකාවක් සපයා ගැනීම

2. **ප්‍රජා ක්‍රියාවන් උත්ප්‍රේරණය**
ප්‍රජාව වෙත අභිප්‍රේරණයක් සපයන, සියල්ල ආවරණය කෙරෙන නිර්දේශ හා ව්‍යාපෘති නිර්මාණය.

3. **ආත්ම ධෛර්ය බල ගැන්වීම**
සංස්කෘතික ප්‍රජාවට ස්වකීය අනාගතයට බලපෑම් ඇති කිරීම සඳහා අභියෝගයන් ලබා දීම සහ පෙළඹවීමක් ඇති කිරීම.

4. **සංස්කෘතික දැනුවත්භාවය ඇති කිරීම**
ව්‍යාපෘති හා හවුල්කාරීත්වයෙහි කේන්ද්‍රය ලෙස උතුරු වෙරළේ ප්‍රාදේශීය දැනුම ඇතුළත් කර ගැනීම.

5. **ස්පර්ශ්‍ය අගය පැහැදිළි කිරීම**
රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සංස්කෘතියේ ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීම.

**6. සැලසුම්කරණය අතරේම ක්‍රියාත්මක වීම**
දිගු කාලීන සැලසුම් සකස් කිරීමට සමගාමීව හවුල්කරුවන් සමග වහා සිදු කළ යුතු දෑ දැන්ම සිදු කිරීම.

---

ඉර්මා බොහොර්කේස්-ගීස්ලර්
වීම් සීසේ පීටර්ස්
ඩෙබරා ඩේවිස්
වෝකර් ගෝට්සේ
ලෝරි ඔනර්
කැරොල් හූපර්
ජෝන් කිල්කලන්
රෂිඩා ලැඩ්නර්-සෙවාර්ඩ්
ඩී.බී. ලැම්ප්මන්
හෙලන් ලෙවින්
ෆර්න් මෙට්කාෆ්
ගේල් මිඩ්ල්ටන්
විලියම් මොරිෂ්
වික්ටෝරි මුන්රෝ
ක්‍රිස්ටියන් පෙන්
මෙලීසා වෙස්ට්
නිකලස් ස්වෙගින්ත්සෝව්

---

**ෆියුචර් කල්චර් නිර්දේශ පිළිබඳව**

ස්ටේට්න් දූපත් කලා සංවිධාන, රාජ්‍ය නිලධාරීන් හා ප්‍රජා කණ්ඩායම් ගණනාවක් විසින් මේ වන විට ෆියුචර් කල්චර් මූලික නිර්දේශ සමාලෝචනය කරමින් සිටී. මේ තාක් දුරට අප විසින් හඳුනාගනු ලැබ ඇති අරමුණු හා නිර්දේශ පහතින් ලැයිස්තුගත කර ඇත.

අදහස් දැක්වීම් හා ප්‍රතිපෝෂණයන් සමායෝජනය කිරීමෙන් පසුව ව්‍යාපෘති කණ්ඩායම විසින් මාර්තු 28 වැනි දින ස්ටේට්න් අයිලන්ඩ් ආර්ට්ස්හි දී පළ කිරීම සඳහා මූලික නිර්දේශ වාර්තාවක් සකස් කරනු ලබනු ඇත. මෙම ලේඛනයෙහි එක් එක් නිර්දේශය සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්කෘතික ප්‍රජාව, රාජ්‍ය අංශය හෝ පෞද්ගලික අංශය මගින් අනුගමනය කරනු ලැබිය හැකි විශේෂිත ක්‍රියා අයිතමයන් අඩංගු වනු ඇත. පාර්ශ්වකරුවන්ගේ හා ප්‍රජාවගේ අනුග්‍රහයෙන් මූලික නිර්දේශ ලේඛනය තවදුරටත් වැඩි දියුණු කෙරෙනු ඇති අතර අවසන් මුද්‍රිත ලේඛනය මෙම සරත් ඍතුවේ දී එළි දැක්වෙනු ලැබෙනු ඇත.

I. දේශීය සංස්කෘතියට රැකවරණය ලබා දීම හා විස්තාරණය
   1. මහජන සහභාගීත්වය ඉහළ නැංවීම
      1.1. හඳුනාගත හැකි සංස්කෘතික පර්ෂද හා ගමනාන්ත ඇති කිරීම

        1.2. නියමිත පරිමාණයක් හා විධිමත් බවකින් යුත් අනන්‍යතාවක් සහිත උත්සව සංවිධානය
    2. ගවේෂණය ප්‍රවර්ධනය
        2.1. විස්තරාත්මක හා සංගත පණිවුඩකරණයක් ගොඩ නැංවීම
        2.2. දූපත්වාසීන් හා සංචාරකයන්ට උතුරු වෙරළේ කතාව දැන ගැනීමට සැලැස්වීම
        2.3. සහජ ඥානයෙන් මාර්ගයන් සොයා ගැනීමේ හා ස්ථානමූලික සංස්කෘතික දැනුවත්භාවය පිළිබඳ මැදිහත්වීම් සැපයීම
    3. සහයෝගීතාව පුළුල් කිරීම
        3.1. කලා හා සංස්කෘතික කටයුතුවල අගය සමායෝජනය හා ඒ වෙනුවෙන් පෙනී සිටීම සඳහා හවුල් හඬක් නිර්මාණය කිරීම
        3.2. ප්‍රජාවන් අතර සහ පෞද්ගලික හා රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් සමග හවුල්කාරීත්වය ඉහළ නැංවීම හා ශක්තිමත් කිරීම
        3.3. සංස්කෘතික ප්‍රජාවන් මූල්‍ය සම්පත් වෙත සම්බන්ධ කිරීම

II. ස්ථානය සම්බන්ධීකරණය හා පුළුල් කිරීම
    4. ජලතීරය සැමරීම
        4.1. සමුද්‍රීය සංස්කෘතියේ අත්දැකීම සංරක්ෂණය හා විස්තාරණය
        4.2. සංස්කෘතිය ඔස්සේ රක්ෂක ප්‍රත්‍යාස්ථිතිය
    5. ඌන උපයෝජිත විවෘත අවකාශය සක්‍රියනය
        5.1. පවතින හරිත අවකාශයන් විස්තාරණය
        5.2. අතරමැදි තත්ත්වයන් සැලකිල්ලට ගැනීම
    6. යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
        6.1. පුද්ගලයන් සංස්කෘතිය සමග ඉදිරියට ගෙන යාම
        6.2. පොරොත්තු වීම හා රැස් වීම සඳහා ස්ථාන නිර්ණය
    7. සංස්කෘතිය සඳහා නිර්මිත අවකාශයක් ගොඩනගා එය සංරක්ෂණය කිරීම
        7.1. සංස්කෘතික ප්‍රජාව ජීවත් වන, රාජකාරී කරන හා හැසිරෙන පවතින අවකාශය සංරක්ෂණය
        7.2. සංස්කෘතික ප්‍රජාවට ජීවත් වීම, රාජකාරී කිරීම හ හැසිරීම සඳහා පවතින හෝ ඓතිහාසික ව්‍යුහයන් අනුගත කර ගැනීම
        7.3. සංස්කෘතික ප්‍රජාව සඳහා ජීවත් වීමට, රාජකාරී කිරීමට හා හැසිරීමට නව සංවර්ධනයන් තුළ දැරිය හැකි අවකාශයන් සැලසුම් කිරීම

---

වැටෙන් එහා
බෙන් මාගොලිස් විසිනි

නාගරික ස්ටේටන් දූපත් අසල්වාසී සැලසුම්කරණ අධ්‍යයනයේ බේ වීදි සැරුම් තීරුව (බේ වීදි සැලසුම) වියදම දරනු ලැබිය හැකි නිවාස තනා සංරක්ෂණය කිරීම සඳහා වන පුරපතිගේ Housing New York, සැලසුමේම කොටසකි. මෙම අධ්‍යයනයේ කොටසක් ලෙස, නගරය විසින් වර්තමාන කලාපකරණය සඳහා අක්කර 45ක කලාපයක් තුළ අනුමත කළ හැකි

භාවිතයන් හා ගොඩනැඟිලිවල විශාලත්වයන්ගේ ආකාරය පාලනය කෙරෙනු ලබන වර්තමාන කලාපකරණය සඳහා වන ඉඩම් පරිභෝජන ක්‍රියා හා වෙනස්කම් යෝජනා කරනු ලැබ ඇත. ප්‍රතිකලාපකරණයේ විෂය පථයට බේ වීදිය, කැනල් වීදය, විකිණීමට හෝ බදු දීමට තිබෙන රජයට අයත් දේපළ තුනක්, ස්ටේප්ල්ටන් (පෙර හෝම්පෝර්ට්) ජලතීර කලාපයේ (සිතියම බලන්න) නගරයේ හිමිකාරීත්වය සතුව ඉතිරිව ඇති කොටසේ පිහිටා ඇති අනාගත සංවර්ධන අඩවි දෙකක් අයත් වේ.

බේ වීදිය මගින් පදිංචිව සිට රැකියාව කිරීමේ වටපිටාවක් නිර්මාණය කර දෙන අතර ව්‍යාපෘතිය මගින් ස්ටේටන් දූපතේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, පවුල් සහ තරුණයන්ට අවශ්‍ය වන ආකාරයේ කුලී පදනම් නිවාස සැලසුමක් සපයනු ඇති බව නගර සභාවේ නියෝජිතයින් විසින් ප්‍රකාශ කරන ලදී. දැනට නව පේළි නිවාස 2569ක්, ආසන්න වශයෙන් වර්ග අඩි 600.000ක වාණිජ අවකාශයක් හා වර්ග අඩි 48,559ක ප්‍රජා අවකාශයක් යෝජනා කරන මූලික වැඩසටහන  පිළිබඳව ප්‍රජා කණ්ඩායම් හා නගර නිලධාරීන් විසින් 2015 මැයි මාසයේ සිට සාකච්ඡා පවත්වනු ලැබේ.
ගොඩනැඟිලිවල යෝග්‍ය හා අභිමත උස, අලුතින් සංවර්ධනය කෙරෙන නිවාසවල වියදම් ධාරිතා මට්ටම හා යටිතල පහසුකම් හා ප්‍රවාහනය සඳහා අවශ්‍ය ආයෝජනවල මට්ටම හා ආකාරය පිළිබඳ අදහස් ඇතුළුව මහජනයා හා තෝරා පත් කර ගනු ලැබූ නිලධාරීන් වෙතින් එකිනෙකට වෙනස් ආකාරයේ ඉලක්කයන් ඉදිරිපත් වී ඇත. ෆියුචර් කල්චර් හවුල්කරුවන් සහ සහභාගිවන්නන් බේ වීදි සැලසුම ප්‍රාදේශීය සංස්කෘතියට සහයෝගීත්වය දක්වන්නේ කෙසේද යන්න අවබෝධ කරගෙන දැනුවත් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටිති. දැනට, අවධානය යොමුව පවතින්නේ, සංස්කෘතික නිෂ්පාදකයිනට ජීවත් වීම, රැකියාව කරගෙන යාම හා හැසිරීම සඳහා ප්‍රමාණවත් අවකාශයක් සහතික කරමින් රාජ්‍ය හා ඌන උපයෝජිත අවකාශයන් වැදගත් සංස්කෘතික හා ප්‍රජා ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්නා අතරේ ඉඩම් භාවිතයේ සිදුවන වෙනස්කම් මගින් ප්‍රාදේශීය සංස්කෘතික ප්‍රජාව ශක්තිමත් කරනුයේ කෙසේද යන්න ගවේෂණය කිරීමයි.

රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම කාලීන යාවත්කාල කිරීම්වල අනාගත පළ කිරීම් සඳහා "වැටෙන් එහා" වෙත මතු යොමු වන්න.

**සම්පත්:**

http://www1.nyc.gov/site/planning/plans/bay-street-corridor/bay-street-corridor.page
http://citylimits.org/2016/10/25/documents-about-the-proposed-bay-street-rezoning/

**ඉදිරි පියවර හා සම්බන්ධ වීමේ අවස්ථා (කාලරේඛාව හා සැලසුම් කළ TBD)**

ජූලි මාසයේ සිට නගරය විසින් ඊසානදිග ස්ටේටන් දූපත ප්‍රතිකලාපකරණය කිරීමේ යෝජනාවෙහි භව්‍ය පාරිසරික බලපෑම් විශ්ලේෂණය කරනු ලබන පාරිසරික බලපෑම් ප්‍රකාශ කෙටුම්පතක් සූදානම් කරමින් තිබිණි. මේ දක්වා ලැබී ඇති ප්‍රජා ප්‍රතිපෝෂණයන් හා

සම්බන්ධතා මත පදනම්ව නගරය විසින් වත්මන් කලාපකරණ යෝජනාව සහ " ප්‍රජා අවශ්‍යතා හඳුනා ගැනීම" ද වැඩි දියුණු කරනු ලැබේ."

1.) අසල්වැසි සැලසුම් කෙටුම්පත
නගරය මගින් කලාපකරණය, නිවාස සංවිධානය හා යටිතල පහසුකම් පිළිබඳව යාවත්කාලීන දැනුම්දීමක් සිදු කරනු ඇත.

2.) සහතිකකරණය හා පාරිසරික බලපෑම් ප්‍රකාශ කෙටුම්පත (DEIS)
සහතිකකරණය මගින් බේ වීදි සැලසුමෙහි හා ආශ්‍රිත ඉඩම් පරිභෝජන යෙදුමේ විධිමත් පොදු සමාලෝචන ක්‍රියාදාමය හා පාරිසරික බලපෑම් ප්‍රකාශ කෙටුම්පතෙහි ඉදිරිපත් කිරීමක් අරඹයි.

3.) අලර්ප් පොදු සමාලෝචනය
1 වැනි ප්‍රජා මණ්ඩලය, නගර සැලසුම් කොමිසම හා නගර කවුන්සිලය මගින් සිදු කෙරෙන මාස 5-7 දක්වා වූ ප්‍රසිද්ධ රැස්වීම් හා සමාලෝචන මාලාවක්

---

**වැඩකරන ජල තීරයෙන්: මතක වස්තු**
**සචින්දර නාවින්න විසිනි**

ආලෝක ධාරාව එල්ල වී ඇත්තේ වේදිකාව මධ්‍යයෙහි හිඳින මා වෙතය. මම ශංඛය දෝතින්ම දරාගෙන හුන්නෙමි. මාස ගණනක පුහුණුවීම්වලින් පසුව මම හක් ගෙඩියෙන් කවර හඬක් නැගේ දැයි සබකෝලයකින් පසුවූයෙමි.  බෙරකරුවන් ඔවුන්ගේ සුරල් වාදනය අරඹනු මගේ සවනේ වැකෙත්ම අභිමානයකින් හා ආත්ම විශ්වාසයකින් මා වෙළා ගනු මට දැනිණි. මම ගැඹුරු හුස්මක් ගෙන, වැරෙන් ශංඛය අල්වාගෙන දොතොල් තද කරගෙන හක් ගෙඩිය පිම්බෙමි. හඬ මහත් නාදයකින්, සුමටව හා දීර්ඝ ලෙස ඇදී යන විට මගේ සිතට සැහැල්ලුවක් දැනිණි. ඒ මොහොතේ ශංඛයෙන් නැගුණු මිහිරි නාදයන් ඉපැදවීමට අවශ්‍ය කළ ශක්තිය, පුහුණුව හා ඉවසීම සිහි වූ කල්හි මගේ මුවඟට ප්‍රීතිමත් සිනහවක් නැඟිණි.

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික නැටුම් කලාව වන උඩරට නැටුමෙහි මූලික කොටස් හැඟවීමට යොදා ගන්නා සංගීත භාණ්ඩයක් ලෙස හක් ගෙඩිය හැඳින්විය හැක. වෙරළෙන් සොයා ගන්නා මෙම වස්තුව විවිධ චාරිත්‍ර වාරිත්‍ර හා සම්ප්‍රදායන් සඳහා යොදා ගැනීමට පෙර පළමුව විෂබීජ නාශනය කිරීමට තම්බා වාෂ්ප අල්ලා අනතුරුව කැටයම් ශිල්පියකු විසින් ඔප දමනු ලැබේ. ශංඛයෙන් නාද නිකුත් වීමට සැලැස්වීම සඳහා මුඛය තබන කොටසෙහි සිදුරක් විදිනු ලැබේ. ශ්‍රී ලංකාවේ සිට ස්ටේට්න් දූපත වෙත ගෙන ආ මෙම ඓතිහාසික සම්ප්‍රදාය ඉදිරියට ගෙන යාමට මම සමත් වූයෙමි.

ඇමෙරිකාවේ ඉපැදී හැදී වැඩෙන බොහෝ යෞවනයින්ට ඔවුන්ගේ අක්මුල් හා සංස්කෘතිය අමතක වී යාම සාමාන්‍ය දෙයකි. වසර විස්සකට ප්‍රථමයෙන් ශ්‍රී ලංකාවේ සිට ඇමෙරිකාවට පැමිණි මගේ දෙමව්පියෝ සිය දරුවන් වෙතින් ස්වකීය උරුමය ගිලිහී යාමට ඉඩ

නොදෙන්නෙමුයි ශපථ කර ගත්හ. උඩරට නර්තනයේ සාම්ප්‍රදායික කලාව මට මගේ මාතෘ භූමිය වන ශ්‍රී ලංකාව සහ ඒ හා බැඳුණු විචිත්‍රවත් සම්ප්‍රදායන් කිසි දින අමතක වී නොයන ලෙස මා මගේ සංස්කෘතිය වෙත ඇද බැඳ තබා ගත්තේය.

ස්ටේටින් දූපත් කලා ජන ජීවිත වැඩසටහන මගින් ස්ටේටින් දූපතේ වැඩකරන ජලතීරය: නිව්යෝක් සිටිහි අමතකව ගිය පේරුවෙහි සමුද්‍රීය ජන ජීවිතය වෙතින් විවිධාකාර හඬවලට අවකාශය සපයන නැවත නැවතත් පළ වන තීරුවක් සම්පාදනය කරනු ලබයි. මෙම ප්‍රජා මූලික වැඩසටහන මගින් සාර්වත්‍රික සංස්කෘතික උරුමයක් ඔස්සේ සමාජ අගනගරයක් වන ස්ටේටින් දූපත් ජල තීරයෙහි පුනර්ජීවනයක් ඇති කිරීම මෙන්ම දේශීය සාමුද්‍රික සම්ප්‍රදායන්ගේ උරුමකරුවන්ගේ කතාවනට ගරු කිරීම හා ඔවුන්ගේ ජීවනෝපායයන්ට සහාය දැක්වීම ද අපේක්ෂා කරයි. ජනජීවිත කතා පෙළේ සෑම ඉදිරිපත් කිරීමක්ම ජනජීවිත වැඩසටහනේ අද්විතීය පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයෙකු විසින් ලියැවෙන අතර සොයාගත් වස්තූන්, භෞතික සංස්කෘතිය හා මතකයන් පිළිබඳව කාව්‍යමය අදහස් දැක්වීමක් සිදු කරයි.



---

උතුරු වෙරළ ජලතීරය ස්ථානයක් ලෙස අවබෝධ කර ගැනීම
මාර්ජී රඩික් විසිනි

අද්විතීය හා තාත්ත්වික වූ ජීවයෙන් උතුරා යන ගම්මාන; මුහුදු සුළඟ ආඝ්‍රාණය කරමින් ද මුහුදේ නාදය ශ්‍රවණය කරමින් ද වෙරළ ඉම ඔස්සේ අඛණ්ඩව ඇවිද යා හැකි ජලතීරය; දැකුම්කලු අන්දමින් පතුරු ගැලවී ගොස් තිබෙන පෞරාණික ගොඩනැඟිලිවලින් තවදුරටත් දෘශ්‍යමාන වන යුග කිහිපයකින් යුත් ඉතිහාසය; සහ නා නා විධ සම්ප්‍රදායන්ගෙන් හා ජාතිකත්වයන්ගෙන් පිරුණා වූ ද බොහෝ කලාකරුවන්, ශිල්පීන් හා ප්‍රජා ක්‍රියාකරුවන්ට වාසස්ථානයක් වූ ද ප්‍රජාවන්ගෙන් සැදුම් ලත් ස්ටේටින් දූපතේ උතුරු වෙරළ ඉතා සරු හා විවිධත්වයකින් යුතු නාගරික දර්ශනයකි. මෙකී සියලු අනුපමේය ලක්ෂණයන්ගෙන් උතුරු වෙරළේ සංස්කෘතිය නිර්මාණය වී ඇති අතර ෆියුචර් කල්චර් ව්‍යාපෘති කණ්ඩායම වශයෙන්

අපගේ කාර්යභාරය වී ඇත්තේ අනාගතය සඳහා එකී සංස්කෘතිය සැදුම් ලත් නානා විධ භූය එකිනෙක බැඳුණු දර්ශනයකට ගෙත්තම් කිරීමයි..

අපට උතුරු වෙරළ ගමනාන්තයක් හා නිවසක් ලෙස නිර්වචනය කිරීමට උවමනා අතරම අප එය සමජාතීය කිරීමට අපේක්ෂා නොකරමු. බේ වීදිය ඔස්සේ පරිසරය නරඹන කල්හි අප තුළ වඩාත් උනන්දුවක් ඇති වන්නේ ඒකීකෘත බේ වීදි සැරුම් තීරුවක් පිළිබඳ අදහස් ඉස්මතු කරලීමට වඩා අනේක විධ වූ නිෂ්පාදනයන් වර්ධනය කිරීම හා වඩාත් සාරවත් සම්බන්ධතා නිර්මාණය කරලීම පිළිබඳවයි. ශාන්ත ජෝජ් හා ටොම්ප්කින්ස්විල් තොටුපොළ ආසන්නයේ පිහිටා තිබීම සහ නිව්යෝක් වීල් හා එම්පයර් අලෙවිසැල් වැනි ඉදිරියේ දී පැමිණීමට නියමිත විචිත්‍රාංග මගින් ඉඟි කෙරෙනුයේ විභූතිමත් ජේරු ගොඩනැඟිල්ල හා පාවුලෝ උද්‍යානයේ සිට වඩාත් සුමට හා මටසිළුටු වූ ටොම්ප්කින්ස්විල් ප්‍රදේශය දක්වා වර්ග කරනු ලැබිය හැකි එක් නිශ්චිත නාගරික සැරුම් තීරුවක් හා වීදි දර්ශනයක් තිබිය හැකි බවයි. එනම් වරුවක සංචාරයකින් පහසුවෙන් ආවරණය කළ හැකි සිල්ලර හා විනෝදාස්වාදී සැරුම් තීරුවකි.

ටොම්ප්කින්ස්විල් හා ස්ටේප්ල්ටන් අතර බේ වීදය ඔස්සේ ඇති සිල්ලර කඩ හා කර්මාන්ත - මේවායෙන් බොහොමයක් ඇත්තේ රියගාල්වලට පිටුපසිනි- ශාන්ත ජෝර්ජ්-ටොම්කින්ස්විල් ප්‍රදේශයට ඉඳුරාම වෙනස් බැව් කිව හැකිය. මෙම ප්‍රදේශය වැහි වතුර කළමනාකරණය කරන, දැඩි අවශ්‍යතාවයක්ව පවතින නිසට සෙවණක් සපයන සහ මංසල් අතරතුර පිරිසිදු වාතාශ්‍රයට අවකාශයක් සපයන, හරිත තීරය සහ ස්ටේට්න් දූපතේ සිට ජලතීරය දක්වා පහතට දිවෙන අනෙකුත් ස්වභාවික ප්‍රදේශයන්ගේ හරිත තුරු ගොමු සහිත ලක්ෂණය ප්‍රතිනිර්මාණය කරන විවිධාංගීකෘත ශාකවලින් හෙබි හරිත පටියක් බවට පත් කළ හැකිය.

උතුරු වෙරළේ ඉහළට වන්නට ජීවත් වන ජන කොට්ඨාස අතීතයේ ජලතීරයෙන් වෙන්ව ජීවත් වූහ. වැටවල් වලින් වටවූ ගොඩනැඟිලි හා මාර්ගයෙන් ඉහළට එසවුණු දුම්රිය සජීවනය කිරීම සඳහා කලාව හා සංස්කෘතිය යොදා ගැනීම මගින් ගම්මාන හා බේ වීදිය වෙතින් ජලතීරය වෙත වඩාත් ශක්තිමත් සම්බන්ධතාවන් දිරි ගන්වනු ලැබිය හැක. බේ වීදිය හා රිච්මන්ඩ් ටෙරස්හි උස් ස්ථානවල සිට වරාය, පහළ මැන්හැටන් අහස් තීරය, හා වෙරාසානෝ පාළම ආදිය ඉතා හොඳින් නැරඹිය හැකි අතර ඒවා මිනිසුන්ට ආරක්ෂිත ලෙස ඇවිදීමට හෝ බයිසිකල් පැදීමට, සෙවණේ ගිමන් හැරීමට හා දැකුම්කලු දර්ශනයන් නැරඹීමට හැකි වන අයුරින් සකස් කළ හැකිය.

මුහුදට බැසීමට හැකි ස්ථාන ගණනාවක්ම සහිත උතුරු වෙරළ ජලතීරය නිව්යෝක් සිටීහි අනගි මිණිවලින් එකක් ලෙස සැලකිය හැක. නිරතුරුවම ඉදිරි වීදියේ අන්තයෙන් සුවිසල් කොන්ක්‍රීට් නෙරුම්වලට ඇදී දියෙහි ඇවිද යන, ඇලිස් ඔස්ටින් උද්‍යානයේ හා වෙනත් නිසසල ස්ථානයන්හි මසුන් දඩයමේ යෙදෙන, නැතහොත් මිලර්ස් ලෝන්ච් ආසන්නයෙහි බෝට්ටු නරඹන මිනිසුන්ගෙන් සමන්විත මේ ප්‍රදේශය සන්සුන් විනෝදය හා ඉසිඹුලැම සඳහා අගනා නවාතැන් පොළකි. එය ජලතීරය කාර්යබහුල නමුත් නිස්කලංක වූ, අහස සිඹින ගොඩනැඟිලිවලින් පිරී නොපැවතුණු මුහුදේ පැවැත්ම ප්‍රබල ලෙස විඳිය හැකි වූ පැරණි නිව්යෝක් නගරය සිහි ගන්වන්නකි. ජලතීරය ඔස්සේ ඉස්මතු වන නව සංවර්ධනයන්ගේ

මෙන්ම නව හෝ ප්‍රතිසංස්කරණය කරන ලද විවෘත අවකාශයන්ගේ ද මෙම ගුණාංගයන් රඳා පවතින පරිදි භූ දර්ශනය වැඩි දියුණු කිරීමට යොමු වූ ව්‍යාපාර, සංවිධාන හා නියෝජිතායතන දිරි ගැන්වීම අපේ අපේක්ෂාවයි.

ස්ටේටන් දූපත යනු ඔබට නගරයෙන් මිදී එහෙත් තවදුරටත් ප්‍රමුඛ නාගරික ප්‍රජාවක් සමග ගැවසීමට හැකියාවක් ඇති බවට හැඟීමක් ඇති කරවන ආකාරයේ ස්ථානයකි. උතුරු වෙරළේ සුවිශේෂත්වය හා අනන්‍යතාව ගොඩ නංවන ගුණාංගයන් ආරක්ෂා කරමින් වැඩි දියුණු කරන අතරේම ඊට අනාගතය වෙත ගමන් කිරීම සඳහා ඉවහල් වන මාර්ගෝපදේශනයන් හා ප්‍රේරකයන් ලබා දීම අපගේ කාර්යය වේ.

---



ඒරන් ඔෆිසර් සිය තුන් හැවිරිදි දියණිය සමීරා වෙනුවෙන්, ශාන්ත ජෝර්ජ්හි ඔවුන්ගේ නිවසේ සිට සුප් නිවමින් සිටී. ප්‍රථම වතාවට නිවෙසක හිමිකාරීත්වය ලැබූ කැසරස් පවුල වසර අටකට ප්‍රථමයෙන් බෘ◌ෘක්ලින් සිට ස්ටේටන් දූපත වෙත පැමිණියේ එහි දී දේපළවල හිමිකාරීත්වය ලැබීමේ අවස්ථාව සලසා දුන් නිසාය. ඔවුන්ගේ උතුරු වෙරළේ දේපළෙහි වටිනාකම ඉතා ශීඝ්‍රයෙන් ඉහළ යාමත් සමග පසුගිය වසර දෙක ඇතුළත ඔවුන් විසින් අත්පිට මුදලට ගනුදෙනු කරන ගැනුම්කරුවන් ගණනාවකගේ ඉල්ලීම් ඉවත ලනු ලැබීය.

21 හැවිරිදි ඩොමිනික් ඇන්ඩර්සන් ඔහුගේ පියා වෝල්ටර් හා ලැබ්රඩෝ වර්ගයේ සුනඛයා පැඩී සමග. ස්ටේටන් දූපතෙහි ඉපැදී එහිම හැදුණු වැඩුණු දූපත්වාසියකු ලෙස ලිංගික පරිවර්තනයකට ලක් වූවකු ලෙස අනන්‍යතාවක් සහිත ඩොමිනික් විසින් ස්වකීය පුද්ගලික ජීවන චාරිකාව පුරාවට උතුරු වෙරළෙහි සිදු වූ ශීඝ්‍ර සංස්කෘතික වෙනස්වීම් අත්දකිනු ලැබුවේය.







10 හැවිරිදි චාල්ස් ජේකබ්ස් සිය මව ෂැරොන් සමග මවුන්ට් සීනායි දේවස්ථානයේ අසුන් ගන්වන්නකු ලෙස ස්වේච්ඡාවෙන් සේවය කරයි. පාරේ තරමක් ඉහළට වන්නට ඇති ඇල්බේනියානු ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථානයෙහි පර්ෂද සාමාජිකයෝ සතිපතා රැස්වෙති.

ස්ටේටන් දූපතෙහි වැසියන් ගත කරනුයේ සංක්‍රාන්තිමය සමයක් බව ඔවුන් කිසිවෙකුටත් රහසක් නොවේ. ඔවුන් ජීවත් වන ආකාරය, එක් රැස් වන අන්දම හා ස්ටේටන් දූපත පිළිබඳ සිතන පතන ආකාරයට බල පා ඇති වෙනසක් උතුරු වෙරළේ සිදුව ඇත. මෙම වෙනස්කම්වලින් ඇති කරනු ලැබිය හැකි බලපෑම් දැන ගැනීමට තවමත් වේලාසන වැඩි නමුත්, මෙම අනුරූ මගින් උතුරු වෙරළේ ජීවත් වන පවුල් හා ජන කොට්ඨාසවල වෘත්තාන්තයන් සැකිලිගත වේ.

---

මූලික කඩඉම්

2017 මාර්තු 28 → ස්ටේටන් අයිලන්ඩ් ආර්ට්ස්හි දී මූලික නිර්දේශ පළ කිරීම

2017 වසන්තය - ගිම්හානය → නිර්දේශ පිළිබඳ වැඩිදුර අදහස් දැක්වීම් හා ප්‍රතිපෝෂණයන් රැස් කිරීම

2017 ගිම්හානය → නිර්දේශ සඳහා අධිවාචනය

→ නිර්දේශ වැඩිදුර සංවර්ධනය කිරීම

2017 සරත් ඍතුව → ස්ටේටන් අයිලන්ඩ් ආර්ට්ස් හා ඇලිස් ඔස්ටින් කලාගාරයේ දී අවසන් නිර්දේශ පළ කිරීම හා ප්‍රදර්ශන පැවැත්වීම

2017 – 2018 සරත් ඍතුව → නිර්දේශවල දක්නට ලැබුණු අදහස් නියමුවන් විසින් පරීක්ෂාවට බඳුන් කිරීම*

*මූල්‍යාධාර සැපයීම පොරොත්තුවෙන්

ෆියුචර් කල්චර් හා සම්බන්ධ වීමට 212-695-2432x7 වෙතින් හෝ futureculture@designtrust.org. වෙතින් ව්‍යාපෘති කණ්ඩායම අමතන්න.

ෆියුචර් කල්චර්

FUTURE CULTURE